| පාඨමාලාව | සාමාන්‍ය ශාස්ත්‍රවේදී (බාහිර) උපාධි පාඨමාලාව<br>ප්‍රථම ශාස්ත්‍ර (බාහිර) පරීක්ෂණය | **සිංප්‍ර 1.2 - සාහිත්‍ය පරිචය** |
|---|---|---|
| දේශක | අපරැක්කේ සිරිසුධම්ම හිමි,<br>සිංහල අධ්‍යයනාංශය,<br>රුහුණ විශ්වවිද්‍යාලය,<br>මාතර.<br>sudhaaparekke@gmail.com | |
| දිනය | 2016. 09. 25 | |

# ගිරා සන්දේශය

**අරමුණු**

- ❖ සන්දේශ කාව්‍ය අතර ගිරා සන්දේශය විශේෂ වන ආකාරය හඳුනා ගැනීම
- ❖ ගිරා සන්දේශයේ අලංකාර භාවිතය පිළිබඳ අවබෝධයක් ලබා ගැනීම
- ❖ ගිරා සන්දේශය විවිධ මාන ඔස්සේ විචාරය කිරීමට හුරු කිරීම

**සන්දේශ**

'දක්වාලීම්' යන අර්ථවාචක සංස්කෘත 'දිශ්' යන ධාතුවට පූර්වයෙන් 'මනාව' යන අර්ථවාචක 'සං' යන උපසර්ග පද යෝජනයෙන් හා ධාතුවෙන් පර ව 'ඝඤ්' යන කෘදන්ත ප්‍රත්‍යය යෝජනයෙන් නිපදවා ගෙන ඇති සන්දේශ යන්නෙහි ව්‍යාකරණ නිරුක්ත්‍යර්ථය නම් 'මැනවින් දක්වාලීම' යන්නයි.

- ❖ **ශබ්දකෝෂ විග්‍රහය**

'උතුමන්ට යවන ලිපි, පණිවුඩය' (පාලි සිංහල ශබ්දකෝෂය)

'ලියමන, පණිවුඩය, දැන්වීම, ආරංචිය, ප්‍රවෘත්තිය, තොරතුරු නියමය' (ශ්‍රී සුමංගල ශබ්දකෝෂය)

- ❖ **සන්දේශ කාව්‍යයක පැවතිය යුතු මූලික ලක්ෂණ හතරකි.**

**ප්‍රේෂක** - සන්දේශය හෙවත් පණිවුඩය යවන තැනැත්තා

**හාරක** - පණිවුඩය ගෙන යන්නා හෙවත් දූතයා

**ග්‍රාහක** - හාරකයා ගෙන යන පණිවුඩය ලබන තැනැත්තා

**සන්දේශ** - ග්‍රාහකයා වෙත ගෙන යනු ලබන පණිවුඩය

මේ අනුව සන්දේශ කාව්‍යය යනු **ප්‍රේක්ෂකයකු විසින් හාරකයකු ලවා ග්‍රාහකයෙකු වෙත පණිවුඩයක් යවන ආකාරයෙන් රචනා කරන ලද කාව්‍ය විශේෂයකි.**

## සිංහල සන්දේශ සාහිත්‍යය

පාලි, සංස්කෘත, දෙමළ වැනි සෙසු සාහිත්‍යයන්ට වඩා වැඩි සන්දේශ ප්‍රමාණයක් සිංහල සාහිත්‍යය සතු ව ඇත. අපට හමුවන දෙසීයකටත් වඩා වැඩි වූ සන්දේශ ප්‍රමාණය ම මෙයට සාක්ෂ්‍ය සපයයි.

- ගම්පොළ යුගයේ දී රචනා වූ තිසර, මයුර යන සන්දේශ දෙක දැනට සිංහල සාහිත්‍යයේ අපට හමු වන පැරණි ම සන්දේශ බව කිව යුතු ය. ඉන් පසු එළඹි කෝට්ටේ සාහිත්‍ය යුගයේ දී සිංහල සන්දේශ කාව්‍යය කෙතරම් නැගී ආවේ ද යත්: එය 'සන්දේශ යුගය' යන අන්වර්ථ නාමය ලැබීමෙන් ම පැහැදිලි වේ. පරෙවි, කෝකිල, සැළලිහිණි, ගිරා හා හංස යන පංච මහා සන්දේශ කාව්‍ය එම යුගයේ සන්දේශ කාව්‍යයන්හි විශිෂ්ටත්වය විදහාපායි.

**සැම සම්භාව්‍ය සිංහල සන්දේශයක් ම පාහේ පොදු සැලැස්මකට අනුව සකස් කළ හැකිය.**

- දූතයාට ආසිරි පැතීම
- දූතයා පැසසීම
- සන්දේශ රචනා කිරීමේ අරමුණ දැක්වීම
- පුර, රජ, දියකෙළි, වන, සැඳෑ, නිසා, උදා වැනුම් දැක්වීම
- දූතයා යන ස්ථානය වර්ණනා කිරීම
- සන්දේශය ලබන තැනැත්තා වර්ණනා කිරීම
- සන්දේශය ඉදිරිපත් කිරීම
- දූතයාට සුබපැතීම

**ගිරා සන්දේශය**

යතිවරයෙකු අතට පිළිගැන්වෙන ප්‍රථම සන්දේශය ගිරා සන්දේශයයි. තොටගමුවේ රාහුල හිමියන්ට අස්න පිළිගන්වා උන්වහන්සේ ලවා විජයබා පිරිවෙනේ නාථ දෙවියන් වෙත එය ඉදිරිපත් කිරීම මෙහිදී සිදු වෙයි.

- **සංඥා** :- ගිරවෙකු දූතයා කොටගත් හෙයින් මෙය ගිරා සන්දේශය නම් විය.
- **නිමිත්ත** :- සයවන පැරකුම් රජුත් ලක් සසුනත් ආරක්ෂා කර දෙන මෙන් රාහුල හිමියන් ලවා නාථ දෙවියන් යැදවීම මෙහි නිමිත්ත වේ.
- **කතුවරයා** :- අවිනිශ්චිතය. ඇතමෙක් මෙය ගුත්තිල කාව්‍යය ලියූ වැත්තැවේ හිමියන්ගේ කෘතියක් බව පවසති.
- **ප්‍රමාණය** :- පද්‍ය 254කි
- **ගමන්මග** :- ජයවර්ධනපුරයේ සිට තොටගමුවේ විජයබා පිරිවෙනට
- කාලය -: 1457-1465

**ශබ්දාර්ථ සංකලනය**

"ශබ්දාර්ථෞ සහිතෞ කව්‍යම්" (භාමහ)

ශබ්දාර්ථ සහිතවත් බව යනු වචන යෙදෙන අනුපිළිවෙළින් ඇති කෙරෙන සමස්ත ශබ්දය හා එම කවියේ ඇති සමස්ත අර්ථය එකට සම්බන්ධ වීමයි.

කවියා ජයවර්ධනපුර සුකොමළ ලියන් මෙසේ වර්ණනා කරයි.

> "කලා සපිරි සිසිවත මන      කලාවන්
> නිලා තිබෙන බැම ඉඳුදුනු      පිලාවන්
> දුලා තතන තන රන හස      පිලාවන්
> බලා පයැද යනු බැරි පුර      කලාවන්"

(මෙපුරඟනන්ගේ මුහුණු සොළොස් කලාවෙන් පිරුණු චන්ද්‍රයා වැන්න. දෙබැම කුඩා දේදුනු යුවලක් සේය.

දූරස්ථ හා අඛණ්ඩ අධ්‍යාපන ඒකකය-රුහුණ විශ්වවිද්‍යාලය

බබළන පයෝධර යුග්මයෝ ස්වර්ණ හංස පැටවුන් සේය. මෙවන් රූ සිරි සැබැවින්ම කාගේ වුව පය නවතන සුලුය.)

"වෙරළ ඉගිළ තුළ රළ වැළ ලෙස උලෙළ
නැබළ පටල පෙළ ලෙළවමිනි කෙළ කෙළ
කරළ කෙරළ මොළ බල දළ දප පහළ
පුවළ සිහළ බළ මුළ බල නිති ඔසළ"

සමාන ශබ්ද රටා සහිත පද රටා එක සමීපයේ යෙදීමෙන් බළ මුළුවේ ඇති තේජාන්විත බව ප්‍රකට වේ. බළ මුළුව උපමා කෙරෙන්නේ සයුරු රළටයි. එහි ඇති ඝෝෂාකාරී බව බළ මුළුව හා මැනවින් ගැළපේ.

අනුප්‍රාසය යනු එක සමාන ශබ්ද ධ්වනි නගන වචන සමීපව යෙදීමයි. කවියා එය දක්ෂ ලෙස භාවිත කර ඇත්තේ මෙලෙසිනි.

"සෙදනා ලොවිනා ලඳුනා ලෙසි නා
රළිනා ලෙළනා සොබනා ගති නා
නඳනා ගඟනා කෙළනා ලිය නා
දකිනා මනිනා හදනා තොසි නා"

එළිසමය රකිමින් කවියා මෙහිදී වර්ණනා කරන්නේ දිය කෙළියෙහි නියුතු කාන්තා පිරිසක්ය. ශබ්ද සහ අර්ථ සංකලනයට ගිරාවෙහි දක්නට ලැබෙන ප්‍රසිද්ධ උදහරණයක් පහත දක්වේ.

"අතු අතිනැද ගසාය තුරු රැ සාය
කෙළන පන්දු ලෙසා ය සහ තො සාය
පැන පැන වන හිසාය මග අ සාය
යන වඳුරන් නිසාය නොව ල සාය"

**ස්වභාව සෞන්දර්ය වර්ණනා**

*හිරු උදාවීම-*

"සඳ රැස් වතුරු ලොව පිරෙමින් බසින ස ඳ
තුරු හිස් අතුරු රැඳි පෙණ පිඬු ලෙස විහි ද
එදවස් උදය වනකුසුමන් දැක නොම ද
සිත තොස් වඩා මඳ නැත් තොගොසින් සබ ඳ"

උදැසන හිරු කිරණත් සමග මෙම වනයෙහි මල් කවියා දක්වන්නේ පෙර දින රැයෙහි සඳ රැස් වතුරු ලොවට වැටෙන කල තුරු හිස්හි රැඳුණු පෙණ කැටි ලෙසය.

*වන පෙත් වැනුම-*

"දිලිහෙන ගගුලැලීය ඇද හැලීය
ගිලිමල් රොනවුලීය සුදු වැලීය
මදමත් හස කැලීය වන විලීය
දැක යව මනකලීය වන මලීය"

**ස්වභාවෝක්තිය**

ස්වභාවෝක්තිය යනු පවතින දෙය එලෙසම පිටපත් කිරීම නොව, වඩා චමත්කාරජනක ලෙස සිද්ධි සමූහයක් එකට ගළපා ප්‍රතිනිර්මාණය කිරීමයි.

"තුරු යටියෙන් හුනු පැටි ලෙහෙනුන් රැගෙ න

දුරස්ථ හා අඛණ්ඩ අධ්‍යාපන ඒකකය-රුහුණ විශ්වවිද්‍යාලය

සිතු අටියෙන් පිඹ ඇඟ පිරිමැද සෙමෙ    න
මල ගොටුවෙන් පැන් පොවමින් අතිනති    න
සිටි පැටිනන් හෙරණුන්ගෙන් වෙයි සොබ    න"

කෝන්ගස් සෙවණෙහි වෙළෙඳාමේ යෙදෙන ලියන් වර්ණනාවට ලක්ව ඇත්තේ මෙසේය.

"වටින නොයෙන් බඩු ඇරගෙන හැම    දාම
වටින මිලට නොවිකොට කොට වෙළ    ඳම
සිටින ලියන් දැක සිහි කර බණ    දාම
වඩින කෝන් ගස් සෙවණේ නොර    ඳාම"

**උපමා, රූපක භාවිතය**

උපමාවක් යනු කිසියම් වස්තුවක් හෝ සංකල්පයක් තවත් දෙයක් සමග සංසන්දනය කිරීමයි. රූපකයක් යනු සංසන්දනයෙන් තොරව කිසියම් වස්තුවක් හෝ සංකල්පයක් එය එයමයි දැක්වීමයි. ගිරා සන්දේශයේ උපමා, රූපක භාවිතයේ ඇති විශේෂත්වයක් වන්නේ දේශීය පරිසරය ඇසුරෙන් එම අලංකාර නිර්මාණය කර තිබීමයි.

"ලක කොමළඟ සමනලගිරි හිසින්    යුතා
හළ මනරඟ මලිගිය මල් දමින්    ගොතා

වරලස රඟ පෙණ වැල හැලිසියෙන්    යුතා
දිලි කළු ගඟ ළඟ වැද හැර ගිමන්    ගතා"

මෙහි දී කවියා කළු ගඟ පිළිබඳ ඉදිරිපත් කරන කාව්‍ය සංකල්පය ප්‍රශස්තය. කවියා කළු ගඟ ලංකාංගනාවගේ සමනල කන්ද නැමැති හිසින් ඇද හැලෙන කෙස් වැටිය ලෙස දකියි. එහිදී කවියා රූපක කිහිපයක් කවියෙහි අලංකරණයට භාවිත කරන්නේ මෙලෙසිනි.

- ලංකාව - කාන්තාවකට
- ඇගේ හිස - සමනල කන්දට
- කෙස් වැටිය - කළු ගඟට
- කළු ගඟෙහි වන පෙණ වැල - එම කේශ කලාපයෙහි ඇති මල්කම්වලට

කවියා උපමා රූපක ඇසුරෙන් ජයවර්ධන පුර කාන්තාවන් වර්ණනා කරන්නේ මේ අයුරිනි.

"කලා සපිරි සිසි වත මන    කලාවන්
නිලා තිබෙන බැම ඉඳුදුනු    පිලාවන්
දුලා තනත තන රන හස    පිලාවන්
බලා පයැද යනු බැරි පුර    කලාවන්"

මුහුණ කලාවෙන් සපිරි සිසි වැනිය; දෙබැම කුඩා දේදුනු දෙකක් වැනිය; පියයුරු ස්වර්ණ හංස පැටවුන් වැනිය. මෙවැනි අලංකරණ යොදා ගනිමින් සහෘද සිත්සතන්හි චමත්කාරය දනවීමට කවියා සමත් වෙයි.

**පරිකල්පන ශක්‍යතාව**

ඒ. වී සුරවීර 'සාහිත්‍ය කලා ප්‍රදීපිකා' කෘතියෙහි පරිකල්පනය යනු සාහිත්‍යකලා නිර්මාණ සඳහා අවශ්‍ය දෑ සිතින් මවා ගැනීම බව දක්වයි. සත්‍ය හා කල්පිතය උපයෝගී කරගනිමින් වෙනස් මෙන්ම නවමු අකාරයකින් ඉදිරිපත් කිරීම මෙහිදී සිදුවෙයි. පරිකල්පනය පහළ වන්නේ ප්‍රතිභා මහිමයෙනි. අපූර්ව වස්තු නිර්මාණය කිරීමේ හැකියාවේ හෙවත් ප්‍රතිභාවේ ප්‍රධානම ලක්ෂණයක් වන්නේ මෙම පරිකල්පනයයි. ගිරා සන්දේශ කතුවරයාගේ පරිකල්පන ශක්‍යතාව ප්‍රකටවන උදහරණ, කෘතිය කියවීමේදී සොයා ගැනීම අපහසු නැත. දිය කෙළි වැනුමෙහි එන පහත කවිය ගිරා සන්දේශ කතුවරයාගේ පරිකල්පන හැකියාව ප්‍රකට කරන්නකි.

"කොමළඟනන් උවනත් උඩුකුරු කොට
තම මුහුළත් බැඳ පිහිනන දියපිට
හැම සියපත් හැකිළෙනු සොමි තරිඳුට
මෙම රඟ යයි පානා වැනි දිනිඳුට"

දිය කෙළියෙහි යෙදී සිටින සුන්දර ස්ත්‍රීන් හකුළුවා ගත් අත් බැඳ ගෙන මුහුණ උඩුකුරු කොට පිහිනීම කවියා දකින්නේ සෞම්‍ය වූ චන්ද්‍රයා අබියස පියුම් හැකිලෙන්නේ මෙසේ යැයි සූර්යයාට පෙන්වීමක් ලෙසය. කවියාගේ මෙම පරිකල්පන ශක්‍යතාව ඉස්මතු වන්නේ මේ අයුරිනි. කවියා දිය කෙළියෙහි යෙදී සිටින කතුන්ගේ මුහුණ සඳට ද, හැකිළුණු දැත් නෙළුම් මල්වලට ද සමාන කරයි. එ අයුරින් කවියා ගොඩනගන නව සංකල්පය නම් සෞම්‍ය වූ චන්ද්‍රයා සේ සුන්දර කාන්තාවන්ගේ මුහුණු දැක ලැජ්ජාවෙන් පියුම් හැකිලී සිටින බවයි. වන වැනුමෙහි දක්නට ලැබෙන පහත කවියෙන්ද ප්‍රකට වන්නේ කවියගේ පරිකල්පන ශක්‍යතාවයි.

"අතු අතිනැද ගසාය තුරු රැසාය
කෙළන පන්දු ලෙසාය සහ තොසාය
පැන පැන වන හිසාය මග අසාය
යන වඳුරන් නිසාය නොව ළසාය"

ගිරා සන්දේශයේ ඇති විශේෂතා පහත මාතෘකා ඔස්සේ තවදුරටත් විමර්ශනාත්මකව අධ්‍යයනය කළ හැකිය.

- ගිරා කතුහිමිගේ ප්‍රතිභාපූර්ණ කවිත්වය
- ගිරා සන්දේශයේ විරිත් භාවිතය
- ගිරා සන්දේශයෙන් හෙළි වන සමකාලීන සමාජය

-උම්මග්ග ජාතකය

අරමුණු

- අනෙකුත් ජාතක කතා අතුරෙන් උම්මග්ග ජාතකය විශේෂ වන ආකාරය හඳුනා ගැනීම
- උම්මග්ග ජාතකයේ කතා කලාව හඳුනා ගැනීම
- උම්මග්ග ජාතකයේ භාෂා භාවිතය පිළිබඳ අවබෝධයක් ලබා ගැනීම

පන්සිය පනස් ජාතකයට අයත් දිගම කතා වස්තුව උම්මග්ග ජාතකයයි. උමගක් සම්බන්ධ කථා ප්‍රවෘත්තියක් ඇති හෙයින් මේ සඳහා උම්මග්ග ජාතකය යන නාමය භාවිත වේ. මෙම කෘතියෙහි කථා නායකයා මහෞෂධ පඬිතුමාය. වෛදේහ රජු, චූලනී බ්‍රහ්මදත්ත රජු, තලතා දේවිය, උදුම්බරා දේවී, පංචාල චණ්ඩි කුමරි, අමරාදේවී, කෙවට්ට බමුණු, සේනක, පුක්කුස, කාවින්ද, දේවින්ද, අනුකේවට්ට යන චරිත මෙම කෘතියෙහි විද්‍යමාන චරිතය.

**උම්මග්ග ජාතකය හා බැඳි විශේෂ කරුණු**

- සිංහලයන් අතර ප්‍රචලිත වූ ජාතක කතා අතර අතිශයින්ම ජනප්‍රිය කතා දෙකක් වශයෙන් වෙස්සන්තර ජාතකය හා උම්මග්ග ජාතකය හඳුන්වා දිය හැකිය
- කුරුණෑගල යුගයේදී සිංහල ජාතක කතා පොත රචනා වීමටත් පළමුව ජාතක කතා පොදු ජනයා අතර ප්‍රචලිත වී තිබේ.
- සාමාන්‍ය ජාතක කතාවක ආකෘතිය ඉක්මවා ගිය විශේෂ ලක්ෂණ සහිත වීම
- ජාතක කතාවන්ට ගැටපද සැපයූ ජාතක අටුවා ගැටපදයේ පවා උම්මග්ග ජාතකයට ගැටපද සපයා නොමැති වීම

- ප්‍රඥාව ප්‍රකට කිරීම සඳහා බෝසතුන් විසින් නිමවන ලද උමඟ මෙහි ප්‍රධාන මෙන්ම වැදගත් අවස්ථාවද වීම

- උම්මග්ග ජාතකය හුදු කතාවක් පමණක් නොව කතා පොකුරක් වීම
- බෝසතාණන් වහන්සේගේ ප්‍රඥා මහිමය විශද කිරීම කෘතියේ ප්‍රධාන තේමාවයි.
- බණ කථා ශෛලිය
- උම්මග්ග ජාතකය දළ වශයෙන් ප්‍රධාන කොටස් තුනකට වර්ග කළ හැකිය. කතාවල විකාශනය දෙස අවධානය යොමු කිරීමෙන් සිදු කරන්නක් මිස මෙය කෘතියේ අන්තර්ගත වන බෙදීමක් නොවේ.

1. ප්‍රශ්න ඇතුළත් කොටස (මෙයින් මහෞෂධයන්ගේ නුවණ විශද කිරීමයි. නිල වශයෙන් නම් ලැබූ ප්‍රශ්න හා නම් නොලැබූ කතා වස්තූද මෙහි අන්තර්ගත වේ. මුලින්ම ඇති නිදාන කතාවෙන් අනතුරුව කෙටිකතා විසි අටක් සඳහන් වේ.)
2. මහ උමංදා කොටස (මෙය මහෞෂධ පණ්ඩිතයන්ගේ රාජ්‍ය විචාරීමේ හෙවත් උපදෙස් දීමේ අවස්ථාවයි. වෛදේහ රජුගේ ප්‍රධාන උපදේශකයා වශයෙන් පත්වීමෙන් අනතුරුව මියුලු නුවර රැකගැනීම උදෙසා ක්‍රියාත්මක කරන ලද නොයෙකුත් ක්‍රියාමාර්ග මේ අතර දැකිය හැකිය.)
3. උමංදාවෙන් පසු කොටස

**උම්මග්ග ජාතකයේ භාෂා භාවිතය**

උම්මග්ග ජාතකයේ භාෂාව පිළිබඳව නොයෙකුත් විද්වතුන් බොහෝ මතවාද දක්වා ඇත. කාව්‍යාත්මක බැවින් ගිලිහුණු එදිනෙදා ජීවිතයේ අදහස් හුවමාරු කර ගන්නා බසක් උම්මග්ග ජාතකයේ ඇතුළත් බව මාර්ටින් වික්‍රමසිංහ මහතා පෙන්වා දෙයි. -මාටින් වික්‍රමසිංහ, ***ජාතක කතා විමසුම.*** 103 පිටුව

- මේ කෘතියේ ඉතා පැරණි සිංහල වදන් මෙන්ම දහතුන් වන සියවසට අයත් යැයි සැලකිය හැකි වචනද වේ. සමහර වචනවල පැරණි ස්වරූපයක් පෙනෙයි.

**උදා-** *''කපු ඇටයක්, තිඹිරි ඇටයක්'' යන තැන්වල ඇටයක් වෙනුවට ''ඇටක්'' යන ස්වරූපය යෙදීම, ''කුරයක්'' වෙනුවට ''කුරක්'' යැයි ද පැරණි ස්වරූපය පෙන්වන වචන කිහිපයකි. එසේම ''උයිත්'', ''කඩක්'', ''පිඬක්'', ''තුඩෙහි'', ''හුවට'', ''ඕවිල්ල'', ''ගොවියා පුත්'' යනු පැරණි පදද වේ. තවද පුස්කොළ පිටපත්වල එතැයි කියන ''දිළිසුනේ යැ'', ''නෙළුම් පතෙකැ'', ''පියා හඬා යන්නේයැ'', ''හුයාරු කොටැ'', ''උළිඳ ඇට'' යන වදන්වලින් ද බසේ පැරණි රූපය හෙළිවේ.''* -පීටර් සිල්වා, උමංදු විනිස. 150-157 පිටු.

- පැරණි වදන්වලට අමතරව ද්‍රවිඩ වදන් බහුළ වශයෙන් යොදාගෙන ඇත. ''අඩයටි'', ''අරුමැ'', ''අංගානි'', ''ඉඩම'', ''ඉදිරි'', ''ඔල්වර'', ''කයිවාරු'', ''කරණම්'', ''විලක්කු'', ''පට්ටෝඩම්'', ''සෙණ්ඩුවාලු'' ආදිය උදාහරණ වේ.

උම්මග්ග ජාතක කතුවරයාට සරල භාෂාවෙන් අදහස් ප්‍රකාශ කිරීමට හැකියාව තිබිණි. උමංදාවේ ඇති සුළු කතාවක් වුවද පරිශීලනය කරන කෙනෙකුට මේ තත්ත්වය මැනවින් වටහාගත හැකි විය. එහි එන කතාවක් කියවන්නෙකුට හෝ අසන්නෙකුට එය අනුවාදයක් යැයි සිතීමට පවා නොහැකි වනු ඇත.

- කතා ව්‍යවහාරය ප්‍රයෝජනයට යොදා ගැනීම ("තොපගේ අඹුවන් උකුස්සා කෙසේ මරා පියා ඇරුගෙන ගියේ ද")
- සරල වැකිවලින් සිදු කරන විස්තර කථනය ("මහරජ නො සිතුව මැනවැ. නුඹවහන්සේගේ වරදක් නො වෙයි. මෙ වූ කලී දුෂ්ට වූ කේවට්ටයාගේ පාප මිත්‍ර සංසර්ගයෙන් වූ දෝෂයෙකි.")
- එකම නිපාතය නිතර නිතර යෙදීම (හා, හෝ, වනාහි)

- දීර්ඝ වාක්‍ය භාවිතය (පිටවක් හෝ පිටු එකහමාරක් දිග වාක්‍ය දක්නට ලැබේ.)
- උපහාසය මුල්කරගත් භාෂාව (බ්‍රාහ්මණ සමාජය විසින් නිර්මාණය කරන ලද චතුර් කුලයන්ගේ ඊනියා උසස් භාවය දැඩි විවේචනයට ලක්වීම මෙයින් සිදු වී ඇත.)
- සරල උපමා භාවිතය

  "අභීත කේශර සිංහ රාජයකු සේ

  අධම වූ කැනහිලුන් සේ

  කොක් කරක් සේ දික් වූ කර ඇතිව

  බස් නමැති හීයෙන්

  නඳුන් උයනක් සේ

  ක්ෂීර සාගරයෙන් නැගි තරංග මාලාවක් සේ"

**මහෞෂධයන්ගේ බුද්ධිප්‍රභාව**

උම්මග්ග ජාතකයේ අන්තර්ගත චරිත අතුරින් බුද්ධිමත් වශයෙන් නැගී සිටින ප්‍රධාන චරිත දෙකක් හැඳිනගත හැකිය. එනම් වේදේහ රජුගේ ප්‍රමුඛ උපදේශකයන් වශයෙන් කටයුතු කරන මහෞෂධයන් සහ චූලනී බ්‍රහ්ම දත්ත රජුගේ උපදේශක වශයෙන් පෙනී සිටින කේවට්ටාචාරීහුය.

මහෞෂධයන් මව්කුස පිළිසිඳ ගන්නා අවධියේ සිටම එතුමා බුද්ධිමතෙකු බවට පත්කිරීමට උත්සාහ ගෙන තිබේ.

*''බෝසතාණන් වහන්සේ මව්කුස පිළිසිඳ ගන්නා දවස් අලුයම් වේලේ සතර පුවුරු කොනැ නබෝ තල්කඳ සා ගිනිකඳ සතරෙක් පවුරෙහි තලක් කට්ටුව උසට නැගී දිලිසෙන්නේය. ඒ ගිනිකඳ සතර මධ්‍යයෙහි කදෝපැණියෙකු සහ ගිනි පුපුරක් නැගී එම ඇසිල්ලෙහි සතර කොණ සිටි ගිනිකඳ සතරෙහි ආලෝක මැඩ ගෙන බඹලොව උසය සක්වල මුළුල්ලෙහි ආලෝක පතුරුවමින් දිළිසුනේ යැ. යටත් පිරිසෙයින් බිම හුණු සර්ෂප මාත්‍රයකුදු පෙනෙන්නේ යැ.''* -***උම්මග්ග ජාතකය,*** (සංස්) කුමාරතුංග මුනිදාස, 09 පිටුව.

- මහෞෂධයන් උපදින අවස්ථාවේ ඔහුගේ අතට ශක්‍රයා සඳුන් ගැටයක් ලබා දීම
- තම ක්‍රියාවන් සුවසේ පවත්වා ගෙනයෑම සඳහා සුදුසු ගෘහයක් නිර්මාණය කිරීම

ඒ ගෘහය සැළසුම් කර සමාජීය පරිසරය අනුව කාමර වෙන් කිරීමද සිදු කෙරිණි. මීට අමතරව ක්‍රීඩා කිරීම සඳහා මණ්ඩපයක්, වෙළෙඳුන්ට නවාතැනක්, දුගී මගීන්ට වෙනම ස්ථාන, අධිකරණ ශාලාවක් ආදියද එයටම අන්තර්ගත කළේය.

*'' මනහර පියගැට පන්තීන් යුක්ත වූ සියක් කොට ඇති පොකුණක් කැරවූ සේකැ. ඒ පොකුණු තොමෝ පස් පියුමින් සැදුම් ලද්දීය. නන්දා නම් පොකුණ නම් මෙන් වුව නැවතැ ඒ පොකුණු අතර අඹ, දොඹ, නා, පනා, සපු, දුනුකේ, ඇසළ, පුවඟු ආදී වූ මල් පල්ලෙන් සැදි සිටුනා නොයෙක් ගස් රෝපණය කර වූ සේකැ.''*

-***උම්මග්ග ජාතකය,*** (සංස්) කුමාරතුංග මුනිදාස, 11 පිටුව.

- උකුස්සා සහ මස් වැදල්ලේ කතාව
- ගොන් බානක් පැහැරගෙන යාම
- ස්ත්‍රියක් හා නොයෙක් වර්ණයෙන් කරන ලද ගැටහු පළඳනාවේ කතාව
- පුත්‍ර ප්‍රශ්නය

උදා-:

*"...දෙන්නාමැ දරුවන් ඇදගත්හ. දරුවෝ දෙන්නා විසින් අදිනු ලබන්නාහු දුකට පැමිණියාහ. මැණියෝ ලය පැළුණු කලක් මෙන් ශෝකයට පැමිණ දරුවන් අතහැර අඬමින් සිටියාහ. බෝසතාණන් වහන්සේ දරුවන් කෙරෙහි වැදුවන්ගේ ළය මොලොක් ද නොහොත් නොවැදූ මවගේ ළය මොලොක් දැයි බොහෝ දෙනා විචාළ සේකැ...."*

- විවාහ ප්‍රශ්නය (දික්තලා, කාලගෝල හා දික්පිටිය)
- මහෞෂධයන්ට දේශපාලන බලයක් ගොඩනැගීම
- විජානන ප්‍රශ්නය
- වැලියොතක් ආශ්‍රයෙන් විමසූ පසළොස් වැනි ප්‍රශ්නය
- තඩාග හා උද්‍යාන ප්‍රශ්න
- බුද්ධිය හා ජනපක්ෂපාතීත්වය නිසා කෙසේ හෝ මහෞෂධයන් තමන් වෙත නතු කර ගැනීමට රජු සිතාගැනීම

**රජුන් බමුණන් උපහාසයට ලක් කළ උම්මග්ග ජාතකය**

"උමංදව බමුණන් හා බමුණු දහම් කර්කශ උපහාසයට භාජනය කෙරෙන කථාවකි. පැරණි භික්ෂූන් රජුන්ගේත් ඔවුනට අනුබල දුන් බමුණුන්ගේත් දෙස් නිර්දය ලෙස හෙළි කළ නිර්භය විචාරකයන් වූ බව උමංදවෙන් හෙළි වේ."

-මාටින් වික්‍රමසිංහ, **ජාතක කතා විමසුම.**

"බමුණු චරිතයක් හමු වූ බොහෝ තැන්වලදී ඔහු හරහා අවමානයට ලක් කොට, හිංසා පීඩාවට ලක්කොට ලිවීම සිංහල ගත්කරුවන්ටද රිසි විය."

-**උමංද විණිස.** සංස්. පීටර් සිල්වා

- බමුණන් පුරෝහිත තනතුරුවල සිටීම බුදුදහමට හිතකර නොවීම
- බමුණන් හා රජුන් එකතුව සාමාන්‍ය ජනයා පීඩාවට පත් කිරීම
- උමංදවේ බමුණන් හඳුන්වා ඇත්තේ උදර පෝෂණය පිණිස රජුන්ට කයිවාරු කරමින් ජීවත් වූ කපටි මිනිසුන් ලෙයසි.
- තත්කාලීන සමාජ වටපිටාව සැලකිල්ලට ගැනීම
- පොදු මිනිසුන් පීඩාවට ලක් කළ වේදේහ, චූලනී බ්‍රහ්මදත්ත රජුන් සහ සේනාක, කේවට්ටාදී බමුණන් මෙම කෘතියේ දැඩි උපහාසයට ලක් කෙරේ.
- ලෝබකම්, අනුවණකම්, කාමුකකම්, කුහකකම්, කපටිකම් වැනි දෑ උපහාසයෙන් විස්තර කිරීම

උදා:-විජානන ප්‍රශ්නයේදී මඟුල් ගොනුට කවා බඩ මහත් කර ඌ පැටවුන් වදවා එවන ලෙස මහෞෂධ වෙත යැවීම

- තඩාග, වාලුකා වැනි ප්‍රශ්නවලදී රජු හා බමුණන්ගේ බුද්ධි මට්ටම උපහාසාත්මකව පැහැදිලි කරයි.
- රජු තමන්ගේ මෙන්ම උපදෙස් දෙන බමුණන්ගේ අඥනකම් ගැන දුක් වූ අයුරු උමංදවේ සඳහන් වන්නේ මෙසේය.

"පණ්ඩිතයනි, ඉදින් තෙපි මෙතැන නැත්තාහු නම් අද මේ නුවණ නැති සේනකයාගේ බස් ගෙන මෙබඳු ගැණු රුවනක් නොලද්දෙම් වෙමි. දැන් තොප නිසා යැ මේ බිසවුන් ලද්දේ"

- රාජ කුමාරයෙකු විසින් උගත යුතු මූලික ශිල්ප ඥණය රජවරුන්ට නොමැති බව බ්‍රහ්මදත්ත ආදී එක් සියයක් රජවරු පලා යන අන්දමින් වැටහේ.

"එක් සියයයක් රජ දරුවෝ සිතන්නාහු මහෞෂධ පණ්ඩිතයෝ වාසල් හරවා පිටත් වූ වන්හ. මෙවිටැ අප හැමගේ ජීවිත නැත්තේ යැ යි භයින් තැති ගෙන උපභෝග පරිභෝග වස්තුවෙන් කිසිවකුත් නො ගෙනැ මගුල් කඩු හා උතුරු සළු ආදී වූ වස්ත්‍රාභරණාදියටත් ආලය නො කොටැ නිගණ්ඨසේනාවක් සේ ඉස් ලූ ලූ අතැ උනුන් නොබලාමැ දිවැ ගත්හ."

- මාටින් වික්‍රමසිංහ පවසන්නේ කේවට්ට යන නම පවා උපහසාස පූර්වකව යොදන ලද්දක් බවයි

උදා-

"මම අමාත්‍ය මණ්ඩලය පිරිවරා සිංහාසනාරූඪවැ උන්නෙමි. මේ තමාගේ බැම රැලියෙන් වැසී තිබෙන්නා වූ ඇටිකුකුළන් ඇස් මෙන් ඉතා රත් වූ ඇසින් බැමය නඟාලා කිපී බලන එකකු මෙන් එක්වන් මා මුහුණ බලන්නේයැ. සීනෙන් දුටුවන් බාන තරම් මොහුගේ රූප විලාසය කඩදත් හා මූණ රත්වූ ඇස් ඇති මොහු රාක්ෂසයකු දුටුවා සේ ඉතා භයපත්ව දක්වා සේයැ'යි සිතමි. එසේමැ විරූප වූ බැලුම් නපුරු වූ බමුණා මෙසෙයින් දියරකුසාට දෙමි'යි කීහ."

- පොළොන්නරු යුගයේ නැගී ආ බමුණු කුලය හා ඒ වටා බැඳි බලය මර්දනයට ග්‍රන්ථ කර්තෘන් විවිධ උපක්‍රම භාවිත කිරීම
- විචාර බුද්ධියකින් තොරව රජයට ගැතිකම් කරන්නවුන් උපහාසාත්මක විවේචනය කිරීම
- රාජ්‍ය ප්‍රධානීන් බුද්ධිමතුන් මෙන්ම දක්ෂ පරිපාලකයන් විය යුතු බව

## ආශ්‍රිත ග්‍රන්ථනාමාවලිය

**උමංදා විනිසස.** සංස්. පීටර් සිල්වා, කොළඹ: ඇම්.ඩී. ගුණසේන සහ සමාගම, 1965.

ගම්ලත්, සුචරිත, **උම්මග්ග ජාතක ප්‍රවේශය.** කොළඹ 10: ඇස්. ගොඩගේ සහ සහෝදරයෝ, 1995.

ගුණසේකර, බන්දුසේන, ඊ. ඒ. වික්‍රමසිංහ, **ගිරා සන්දේශය හා විචාරය හා රසාස්වාදය.** 1994.

වික්‍රමසිංහ, මාටින්, **ජාතක කතා විමසුම.** කොළඹ: ඇම්.ඩී. ගුණසේන සහ සමාගම, 1968.

සන්නස්ගල, පුඤ්චිබණ්ඩාර, **සිංහල සන්දේශ සාහිත්‍ය ඉතිහාසය.** කොළඹ: දිනමිණ මුද්‍රණාලය, 1955.

සන්නස්ගල, පුඤ්චිබණ්ඩාර, **සිංහල සාහිත්‍ය වංශය.** කොළඹ: ලේක්හවුස් මුද්‍රණාලය, 1961.

සුරවීර, ඒ.වී. **සාහිත්‍ය කලා ප්‍රදීපිකා.** කොළඹ 10: ෆාස්ට් පබ්ලිෂින් ලිමිටඩ්, 2005.

දුරස්ථ හා අඛණ්ඩ අධ්‍යාපන ආයතනය-රුහුණ විශ්වවිද්‍යාලය